රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 25/2017

මගේ අංකය : EST-6/WARNT/07/3020
රාජ්‍ය පරිපාලන හා
කළමනාකරණ අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2017.09.21

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

**<u>ආයතන සංග්‍රහයේ XVI වැනි පරිච්ඡේදයේ 1 වගන්තිය අනුව</u>**

**<u>විශ්‍රාමිකයෙකුට දුම්රිය බලපත්‍ර හිමිකම</u>**

ආයතන සංග්‍රහයේ XVI වැනි පරිච්ඡේදයේ 1 වගන්තිය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එකී වගන්තියේ 1:1 උප වගන්තියෙහි ඇතුළත්ව ඇති “විශ්‍රාමිකයෙකුට හා ඔහුගේ පවුලේ සාමාජිකයන්ට, යෑමට හා ඊමට දෙන බලපත්‍ර දෙකක් (එනම් කට්ටල දෙකක්)” යන්න “විශ්‍රාමිකයෙකුට හා ඔහුගේ පවුලේ සාමාජිකයන්ට, යෑමට හා ඊමට දෙන බලපත්‍ර තුනක් (එනම්, කට්ටල තුනක්)” ලෙස 2017 වර්ෂයේ සිට අදාළ වන පරිදි සංශෝධනය කිරීමට 2017.08.15 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

03. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කෙරේ.

ජේ. ජේ. රත්නසිරි
ලේකම්
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය